00089

THE OPEN UNIVERSITY OF SRI LANKA ★ LIBRARY

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ
ඩිප්ලෝමා වැඩ සටහන - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2009/2010

ESD 2230 – ළමා සංවර්ධනය II

කාලය - පැය 03 යි.

---

දිනය - 2010.06.05 වේලාව - පෙ.ව. 09.30 - ප.ව.12.30

---

පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලටද, දෙවන කොටසේ ප්‍රශ්න තුනකට පමණක් ද පිළිතුරු සපයන්න.

I - කොටස

01. i. අපගේ ස්නායු පද්ධතියේ ඇති නියුරෝන වර්ග තුන නම් කරන්න.

ii. ඉහත වර්ග අතරින් එකක් තෝරාගෙන එහි ක්‍රියාකාරිත්වය විස්තර කරන්න.

02. i. " ප්‍රජානනය" යන්න ඔබගේ වචනයෙන් විස්තර කරන්න.

ii. 'ප්‍රජානනය' කෙරෙහි දායක වන චින්තන ක්‍රියාවලින් තුනක් නම් කරන්න.

03. i. "පෞරුෂය" යන්න ඔබේ වචනයෙන් විස්තර කරන්න.

ii. "තුමුල - පහ"(Big – Five) පෞරුෂ ආකෘතිය මගින් Luewis Goldberg ලුවිස් ගෝල්ඩ්බර්ග් විසින් ඉදිරිපත් කරන ලද පෞරුෂ පැතිකඩ පහ (05) ලැයිස්තු ගත කරන්න.

04. i. "වෙන්වීමේ කාංසාව" (Sepe¾tion anxiety) කෙරෙහි බලපාන හේතු තුනක් (03) ලැයිස්තු ගත කරන්න.

ii. පෙර පාසල් ළමයින් තුළ වෙන් වීමේ කාංසාව අඩු කිරීම සඳහා ගුරුවරයෙකුට ගත හැකි ක්‍රියා මාර්ග (03) ක් විස්තර කරන්න.

05. i. ස්නායු පද්ධතියේ මූලික ආකෘතිය කුමක් ද?

ii. ඉහත ආකෘතිය ඇඳ, එහි වැදගත් කොටස් උචිත පරිදි නම් කරන්න.

06. i. "සංජානනය" යන්න ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

ii. ගෙස්ටෝල්ට් මනෝ විද්‍යාඥයන් විසින් සංජානන රටා ඇති කිරීම පිළිබඳව ඉදිරිපත් කළ මූලධර්ම තුනක් (03) නම් කරන්න.

00089

07. i. "හිතිකාවක්" යනු කුමක් ද? සුදුසු උදාහරණ සමග පැහැදිලි කරන්න.

ii. වැඩිහිටියන්ගේ චර්යා රටා බාල ළමයින් තුළ හිතිකා ප්‍රතිචාර ඇති කරන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න.

08. i. කාල් රොජර්ස්ගේ අදහස් වලට අනුව පුද්ගලයෙකුගේ පෞරුෂය කෙරෙහි ඉතාම වැදගත් අංගය නම් කරන්න.

ii. රොජර්ස්ගේ සිද්ධාන්තයට අනුව ළමයින්ගේ පෞරුෂය තුළ විකෘතින් ඇති වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## <u>II - කොටස</u>

09. i. නියුරෝනයක මූලික ක්‍රියා කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 08)

ii. ප්‍රාථමික පාසල් ගුරුවරුන් සඳහා මානව චර්යාවේ ජීව විද්‍යාත්මක පදනම පිළිබඳ දැනුමෙහි ප්‍රයෝජන සාකච්ඡා කරන්න.
(ලකුණු 12)

10. i. අවධානය සියළු ප්‍රජානන ක්‍රියාදාමයන්ට කේන්ද්‍රිය වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.
(ලකුණු 04)

ii. ළමයින්ගේ අවධානය කෙරෙහි බලපෑ හැකි අභ්‍යන්තර සහ බාහිර සාධක තුන (03) බැගින් සාකච්ඡා කරන්න.
(ලකුණු 08)

11. i. සිග්මන් ෆ්‍රොයිඩ් ඉදිරිපත් කළ යථාර්ථ මූල ධර්මය කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 04)

ii. යථාර්ථ මූලධර්මය අනුව පුද්ගලයෙකුගේ පෞරුෂය හැඩ ගැස්වීම සඳහා සංස්කෘතියේ දායකත්වය විශ්ලේෂණය කරන්න.
(ලකුණු 08)

iii. යථාර්ථ මූලධර්මය මත පදනම් වෙමින් ප්‍රාථමික පාසල් දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය සඳහා සුදුසු ක්‍රියාකාරකම් පහක් (5) ක් ඉදිරිපත් කරන්න.
(ලකුණු 08)

12. i. පුද්ගලයන්ගේ පෞරුෂය තක්සේරුව සඳහා භාවිතා කෙරෙන ප්‍රධාන පෞරුෂ පරීක්ෂණ වර්ග දෙක නම් කරන්න.

(ලකුණු 02)

ii. පෞරුෂ පරීක්ෂාවේදී තනි පුද්ගලයන් සඳහා භාවිතා කිරීමට සුදුසු පෞරුෂ පරීක්ෂණය නම් කර විස්තර කරන්න.

(ලකුණු 08)

iii. ඔබගේ පෙර පාසල් ළමයින්ගේ පෞරුෂ තක්සේරුව සඳහා ඔබ උගත් න්‍යායන් පදනම් කර ගනිමින් පිරික්සුම් ලැයිස්තුවක් සංවර්ධනය කරන්න. අවම වශයෙන් අයිතම 10 ක් ලැයිස්තුවට ඇතුළු කරන්න.

(ලකුණු 10)

13. පහත සඳහන් ඕනෑම දෙකක් (02) සඳහා කෙටි සටහන් ලියන්න.

i. ඩෙකාට්ස් සහ ප්‍රතික සංකල්පය
ii. පංතිකාමරය තුළ ADHD ළමයින් කළමනාකරණය
iii. මනෝ විද්‍යාත්මක අක්‍රමතා සහිත ළමයින්ට උදව් කිරීමේ දී ගුරුවරයාගේ භූමිකාව

ලකුණු 10 x 2 = 20
මුළු ලකුණු 40+20 x 3 = 100

\- හිමිකම් ඇවිරිණි. -

THE OPEN UNIVERSITY OF SRI LANKA

DIPLOMA IN EARLY CHILDHOOD & PRIMARY EDUCATION – LEVEL 4

FINAL EXAMINATION – 2009/2010

ESD 2230 – CHILD DEVELOPMENT II

DURATION : THREE (03) HOURS

DATE: 05th June 2010 TIME : 09.30 a.m.-12.30 p.m.

**Answer all questions in Part I and any three of Part II.**

## PART - I

01. i. Name 3 types of neurons in our nervous system.
    ii. Select one of the above types and describe its functions.

02. i. Describe 'cognition' in your own words.
    ii. Name three (03) thoughts processes that are involved in cognition.

03. i. Describe "personality" in your own words.
    ii. List five personality dimensions introduced by Lewis Goldberg in his Big-five personality model.

04. i. List out three (03) reasons leading to "Separation Anxiety" in a pre-school child.
    ii. Describe three (03) actions a teacher can take to reduce the separation anxiety in pre-school children.

05. i. What is the basic structure of nervous system?
    ii. Draw and name the important parts the above structure appropriately.

06. i. Explain 'perception' in your own words.
    ii. Name three principles explained by Gestalt Psychologists that would lead to form perceptual patterns.

07. i. What is a 'Phobia'? Explain with suitable examples.
    ii. Explain briefly how adult's behaviour would lead to create phobic reactions in young children.

08. i. In line with Carl Roggers ideas, name the most important component in one's personality.
    ii. Explain how a distortion occurs in children's personality as explained by Roggers theory.

(5 x 8 = 40 marks)

## PART - II

09. i. Briefly describe the basic functions of a Neuron.

(08 marks)

ii. Discuss the uses of the knowledge about the 'Biological Basis of Human Behaviour' for primary school teachers.

(12 marks)

10. i. Explain why attention is central to all cognitive processes. Cite appropriate examples as necessary.

(10 marks)

ii. Discuss three(03) internal and three(03) external factors that would influences children's attention.

(10 marks)

11. i. Briefly explain the "reality principle" presented by Sigmund Freud.

(04 marks)

ii. Analyse in line with reality principle, the involvement of culture in shaping one's own personality.

(08 marks)

iii. Present five activities suitable for primary school children for development of their personality which are based on the 'reality principle'.

(08 marks)

12. i. Name the two (02) main types of tests used to assess one's personality.

(02 marks)

ii. Name and explain a personality test that is suitable to assess individual personality.

(08 marks)

iii. On the basis of the theories you have learnt, develop a checklist to assess personality of your own pre-school children. Include minimum of 10 items in the check list.

13. Write short notes on <u>two</u> of the followings.

i. "Descartes and the Reflex concept"

ii. Identifying and managing ADHD children in the classroom

iii. Teacher's role in helping children with psychological disorders.

(2 x 10 marks)

(Total marks 40+20 x 3 = 100 marks)

*- Copyrights reserved -*